## ජීවිතය ජය ගන්නට වෙර දරන පද්ම ලතා

එම්. ජී. පත්ම ලතා මොණරාගල දිස්ත්‍රිකයේ අති දුෂ්කර ගම්මානයක් වන බිබිල තිත්තවැල් කිවුල ග්‍රාමය නිජබිම කැර ගත් දිරිය කාන්තාවකි. දරිද්‍රතාවය හා දුෂ්කරතා උපතින්ම රැගෙන ආ පද්ම ලතා තම ජීවිකාව ගොඩනඟා ගැනීමට මහා පොළෙව සමඟ පෙර බදින අන්දම දුටුවන්ගේ සිත් කම්පා කරවන සිද්ධියකි.

සිය සැමියා, පත්ම ලතාව හැර යෑමත් සමඟ ජීවිතය වටා අභියෝග රැසක් මතු විය. දෑස් ආබාධික වැඩිමහල් දියණිය රැක බලා ගැනීමත්, පාසල් යන දෙවැනි දියණියට හොඳ වටාපිටාවක් සකසා දීමටත් වියපත් මව පෝෂණය කිරීමටත් හැකි මාර්ග ගැන ඇය නිරන්තරයෙන් අවදානය යෙමු කෙළේය. ස්ථිර ආදායම් මාර්ගයක් සකසා ගැනීමට ඇයට තිබූ එකම මඟ මහා පොළව ගැන තිබූ විශ්වාසය පමණී.අවසානයේ කැත්ත , උදැල්ල අතට ගෙන මහා පොළවත් සමඟ පොරබදින්නට ඇය තීරණය කෙළේ කුසගින්න ඉවසා ගැනීමට නොහැකි විටය.

අව්ව , වැස්ස සියල්ල ම ආශිර්වාදයක් කැර ගනිමින් පද්ම ලතා තමන්ට අයත් එකම ඉඩම් කැබැල්ලේ වගා කටයුතු ආරම්භ කරමින්, සිය ආර්ථිකයට ශක්තියත් අත් කැර ගන්නට වෑයම් දැරීය. ඒ වන විට ප්‍රාද්ශයේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ආරම්භ කැර තිබූ වගා ආධාර ව්‍යාපෘති වැඩ සටහනට සම්බන්ධ වූ පත්ම ලතා, අන්නාසි වගා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ආධාර පැතීය. එම ආධාරයෙන් සිය අන්නාසි වගාව ආරම්භ කළ ඇය, එයින් යම් තරමක් දුරට තම පවුලේ ආර්ථිකය සවිමත් කැර ගන්නට මගක් පදා ගත්කේය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්, ලැබුණු උපදෙස් අකුරටම පිළිපැද්ද පත්ම ලතා, සිය කාලය, ශ්‍රමය අන්නාසි වගාව වෙනුවෙන් ම කැප කෙළේය.

මේ වන විට අක්කරයකට ආසන්න ප්‍රමාණයක් අන්නාසි වගාව කැර ඇති පද්ම ලතා , වාර්ෂික කන්නයෙන් කිලෝ 1500–2500 අතර ප්‍රමාණයක් වෙළෙඳ පොළ වෙත යැවීමට අද සමත් වී ඇත. ඊට අමතරව අන්නාසි අස්වැන්න පෞද්ගලික ආයතනයකට අලෙවි කිරීමට ද අද ඇය සමත් වී ඇත . ඇතැම් අවස්ථාවලදී මෙයට වඩා වැඩි අස්වැන්නක් නෙලා ගැනීමට සමත් වන ඇය, බිබිල වෙළෙඳ පොළ තුළ සිය සැපයුම් අධිකාරිය ගොඩනඟා ගැනීමට සමත් වී ඇත්තේ අන්නාසි වගාව සිය ජීවිකාව කැර ගත් නිසාය.

එසේම මෑත කාලයේ ඇය තවත් වගා ව්‍යාපෘතියකට අත ගසා ඇත. පෞද්ගලික ආයතනයක් ආරම්භ කැර ඇති ‘ නයි මිරිස් වගා ’ ව්‍යාපෘතිය හා සම්බන්ධ වන පත්ම ලතා අන්නාසි වගාවට සමාන්තරව මෙම වගාව ද (‘ නයි මිරිස් වගා) සිදු කැර ගෙන යයි. ස්වභාවික පරිසරයෙන් ලැබෙන කාබනික පොහොර මනා ලෙස යොදා ගනිමින් ඇය සිය වගා කටයුතු සිදු කැර ගෙන යන්නේ කාටත් ආදර්ශයක් සපයමිනි. ඇය සිය වගා කටයුතුවලට විවිධ කෘමි නාශක ප්‍රමිතියෙන් යුතුව සකසා භාවිතාවට ගනු ලබන්නේ ලැබුණු උපදෙස් සැලකිල්ලට ගනිමිනි. අවසානයේ නොලා ගන්නා අස්වැන්න සිය දෑතින්ම ඔසවා ගෙන වෙළෙඳ පොළට ගෙන යන්නේ පද්ම ලතා ම වීම විශේෂත්වයකි. පද්ම ලතා කිසිදු බිම් අගලක් අපතේ යෑමට ඉඩ නොදී දෛනික අවශ්‍යවයන් සපුරා ගැනීමට අවශ්‍ය වන විවිධ එළවළු වර්ග ක්‍රමානකුලව වගා කිරීමට අද පටන් ගෙන තිබේ. තවත් පැත්තකින් තම ගම් පියසේ සිටින ආර්ථික අපහසුතාවලින් මිරිකී සිටින කාන්තාවන්ට සාර්ථක වගා ව්‍යාපෘතියක් කැර ගෙන යන්නේ කෙසේද යන්න පිළිබඳව පුහුණුව ලබා දෙන , කුඩා වගා බිම් ව්‍යවසායිකාවක් මෙන්ම දක්ෂ ගෙවිලියක්ද වී ඇත.

**සටහන-.**

**ගයානි අසිංසලා පියදිගම**

**ඌව පළාත - බිබිල**